සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**07 ශ්‍රේණිය** **චිත්‍ර කලාව** **කාලය පැය 02 යි.**


නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රය ලිඛිත සහ ප්‍රායෝගික වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය. කොටස් දෙකට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01 ........................................................................................ ලෙන ප්‍රාග් ඓතිහාසික සිතුවම් දැකිය හැකි ස්ථානයකි.

02 මෙහි චිත්‍ර ඇඳීමේදී රේඛා ක්‍රමය හා ........................................................ ක්‍රමය යන ක්‍රම දෙක භාවිතා කර ඇත.

03 මෙහි දැකිය හැකි චිත්‍ර අතර ................................................... සහ පැටවා වැදගත් නිර්මාණයක් ලෙස සැලකේ.

04 ........................................................................ විසින් මෙම චිත්‍ර 1919 දී සොයාගෙන ඇත.

05 මෙම ලෙන පිහිටා ඇත්තේ ....................................................................... දිස්ත්‍රික්කයේ ය.

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

06 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර දැකගත හැකි ස්ථානයක් නොවන්නේ,

(1) තන්තිරිමලේ (2) දොරවක (3) සීගිරිය (4) බිල්ලෑව

07 තන්තිරිමලේ ලෙන පිහිටා ඇත්තේ,

(1) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය. (2) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ය.

(3) කෑගල්ල දිස්ත්‍රික්කයේ ය. (4) රත්නපුර දිස්ත්‍රික්කයේ ය.

08 රූකඩ නිර්මාණ සාර්ථක කර ගැනීම සඳහා ඉවහල්වන අංගයක් නොවන්නේ,

(1) පසුබිම් සංගීතය (2) ගීත ගායනය

(3) දෙබස් කථනය (4) සංස්කරණය

09 රූපවාහිනී මාධ්‍ය තුළ වඩාත් ජනප්‍රිය රූකඩ නිර්මාණ වන්නේ,

(1) නූල් රූකඩ (2) අත් රූකඩ

(3) ඇඟිලි රූකඩ (4) සෙවනැලි රූකඩ

10 වී ගොඩක හැඩය ඇති ස්තූපය

(1) බුබ්බුලාකාර හැඩය ගනී. (2) ධාන්‍යාකාර හැඩය ගනී.

(3) පද්මාකාර හැඩය ගනී. (4) ඝණ්ඨාකාර හැඩය ගනී.

- **අංක 11 - 15 දක්වා දී ඇති වාක්‍ය හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11 සිංහල සැරසිලි අතර අරිම්බුව නිර්ජීවී සැරසිල්ලකි. ( )

12 ස්තූපවල ධාතු තැන්පත් කර ඇත්තේ දේවතා කොටුව තුළය. ( )

13 ඉස්ලාම් ආගමික ස්ථානවල අරාබි අක්ෂරවලින් විවිධ හැඩ මතුවනසේ ආගමික පාඨ ලියා ඇත. ( )

14 රුවන්මැලි සෑ මළුවේ පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රතිමාවක් තැන්පත් කර ඇත. ( )

15 අභයගිරි ස්තූපයට පිවිසෙන දොරටුව දෙපස සංඛ නිධි සහ පද්ම නිධි යනුවෙන් මුරගල් දෙකක් ඇත. ( )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැනට යොදන්න.**

( කුඩා / අල්තාරය / කුම්බා / සංගත / සිද්ධාන්ත )

16 මුස්ලිම් දේවස්ථානවල වහලයට ඉහළින් ඇති උස් වූ නිර්මාණය ........................................... නමින් හඳුන්වයි.

17 ක්‍රිස්තියානි දේවස්ථානවල පූජකතුමා හා ප්‍රතිමා තබා ඇති ස්ථානය .................................................. නම් වේ.

18 දාගැබ් අංගයක් වන වටදාගෙය ............................................................................... චෛත්‍ය සඳහා ඉදිකර ඇත.

19 සිලින්ඩරාකාර ජෝගුවක දමූ මල් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කිරීමේ දී ............................................ භාවිතා කළ යුතුය.

20 නිල් වර්ණයට දම් වර්ණය ........................................................................................................... බවක් දක්වයි.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- **ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.**
- **දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.**
- **ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.**

---

01 වෙසක් උත්සවයට සූදානම් වන බැතිමතුන්

02 ඔබේ පංති කාමරයේ ගුරුතුමිය සමග සිසුන්

03 දිය කඩිත්තක් අසල විවේක ගන්නා මුව රැළ

04 මල් සහ කැකුළු භාවිතා කරමින් වීත්තයකට මෝස්තරයක්

05 සුරතල් සතෙකුගේ හැඩයක් නිර්මාණාත්මකව භාවිතා කරමින් ළමා ඇඳ ඇතිරිල්ලකට මෝස්තරයක්

06 ''අපේ පාසලේ විවිධ ප්‍රසංගය'' යන පාඨය දැන්වීමකට සුදුසු ලෙස නිර්මාණාත්මකව අඳින්න.

(ලකුණු 60 යි)

### පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | දොරවක | 02 | සීරිමේ | 03 | ඇතා | 04 | ජී. එෆ්. ආර් බ්‍රෝහියර් |
| 05 | කෑගල්ල | 06 | සීගිරිය - 3 | 07 | අනුරාධපුර - 1 | 08 | සංස්කරණය - 4 |
| 09 | අත් රූකඩ - 2 | 10 | ධාන්‍යාකාර - 2 | 11 | ✓ | 12 | × |
| 13 | ✓ | 14 | × | 15 | ✓ | 16 | කුම්බා |
| 17 | අල්තාරය | 18 | කුඩා | 19 | සිද්ධාන්ත | 20 | සංගත |

(2 x 20 = 40)

I කොටසට ලකුණු 40 යි.

II කොටසට ලකුණු 60 යි. මුළු ලකුණු 100 යි.